# 2012 කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

உணவு ஆணையாளர் திணைக்களம்

Food Commissioner's Department

DIBSS

For Long-Life Rice

DIBSS

For Long-Life Rice

# කාර්යසාධන වාර්තාව

# 2012

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

නො: 330,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

දුරකතන : *011- 2421211*
ෆැක්ස් : *011- 2434291*

# පෙරවදන

පෙරදිග ධාන්‍යාගාරය නමින් ප්‍රකට මේ දිවයින නිජබිම් කොටගත් බහුතරයක් ජනතාවගේ ආහාර අවශ්‍යතා පිළිබඳව අමුතුවෙන් සිතා බැලීමේ අවශ්‍යතාවයක් එකළ නොතිබුණි. තමනට අවශ්‍ය තරම් ධන ධාන්‍යයෙන් අටුකොටු පිරී තිබුණි. ඒ එදා බොහොමයක් ගොවිතැන ජීවනෝපාය කොටගෙන තිබූ බැවිනි. වනය පුරා එළ වැල ඕනෑ තරමට හැදී වැඩී තිබුණි. දේශගුණය, කාලගුණය ජීවනෝපායට ගැලපෙන යහපත් මට්ටමකින් පැවතුණි.

අද තත්වය ඊට වඩා බෙහෙවින් වෙනස් වී ගොස්ය. ජනගහනය සීඝ්‍ර වශයෙන් වර්ධනය වී ඇතත් ගොවිතැන ජීවනෝපාය කරගත් ජනතාව අතලොස්සකි. හදිසියේ සිදුවන කාලගුණික උපද්‍රවයන් බොහෝය. නිරන්තරයෙන් ඇතිවන කාලගුණික විපරීතතාවන් මත විනාශ වී යන ගොවිබිම් අපමණය. පාරිභෝජන අවශ්‍යතාවය අති විශාලය. මෙකී අයහපත් තත්වයන්ගෙන් අසීරුවෙන් මුදවාගත් වගාබිම් තුළින් නෙළා ගන්නා ධාන්‍ය පරිමාවෙන් අසීමිත පාරිභෝජන අවශ්‍යතාව සපුරා ගැනීම මූලික ගැටළුවක් බවට පත්ව ඇත. මේ හේතුව නිසා අපට අවශ්‍ය සහල් විදේශයන්ගෙන් ආනයනය කළ අවස්ථාවන් පිළිබඳවද අප අසා ඇත. සංවර්ධනය වෙමින් පවත්නා රාජ්‍යයකට ආහාර ආනයනය අතිමහත් බරකි. විශාල මුදල් නාස්තියකි.

මේ තත්වයෙන් මිදීම සඳහා රජය විසින් ආහාර සුරක්ෂිතතාවයට මූලිකත්වයක් ලබාදී තිබේ. සෑම විටකම පාරිභෝජන අතිරික්ත සුරක්ෂිතව ගබඩා කර තබා ගැනීම තුලින් ඌණ පාරිභෝජන අවශ්‍යතාවය පිරිමසා ගැනීමට මාර්ගෝපදේශ ලබාදෙනු ඇත. එම මාර්ගෝපදේශයන් තේමා කොට ගනිමින් සහල් මෙ.ටො.100000 ක ආරක්ෂිත සහල් තොගයක් පවත්වාගෙන යාමේ කාර්ය භාරය ආහාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. එම ඉලක්ක ගත ආරක්ෂිත තොගය මැනවින් පවත්වාගෙන යාම ආහාර දෙපාර්තමේන්තුවේ වගකීමද වී තිබේ.

මිනිස් පාරිභෝජනය සඳහා සුදුසු මට්ටමින් සහල් ගබඩා ගත කර තබාගත හැකි සාමාන්‍ය කාලය මාස 4ක් පමණ වන නමුත් හදිසි ආපදා පන්න අවස්ථාවන්හිදී හා වෙළඳ පොළ සැපයුම අවප්‍රමාණ වන අවස්ථාවලදී සිදුවන මිළ උච්ඡාවචනයන් අවම කර ගැනීම පිණිස සාධාරණ මිළක් මත සහල් තොග වෙළඳ පොළට සැපයීම අරමුණු කොට ගනිමින් පවත්වාගෙන යනු ලබන ආරක්ෂිත තොග මාස 04 ක් වැනි කෙටි කාලයක් තුළ මුදා හැරීමට ඉඩකඩක් නොමැත. සාමාන්‍ය ගබඩාවන් තුළ මෙවන් තොග පවත්වාගෙන යාම හේතුවෙන් මිනිස් පාරිභෝජනයට නුසුදුසු තත්ත්වයෙන් යුතුව එම සහල් තොග බැහැර කිරීමට සිදුවූ අමිහිරි අත්දැකීම් දෙපාර්තමේන්තුව සතුව ඇත.

එම නිසා එවන් තත්වයක් යළි ඇති නොවන අන්දමින් හා අරමුණ සාක්ෂාත් වන අන්දමින් සහල් ආරක්ෂිත තොග පවත්වාගෙන යා හැකි ක්‍රමවේදයන් හඳුනාගැනීමේ නව ඉසව්වකට ගමන් කිරීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමුව ඇත. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේ විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිතයට ගනිමින් වැඩි කාලයක් සහල් ආරක්ෂිත තොග ගබඩා ගත කර පවත්වාගෙන යා හැකි ක්‍රමවේදයන් අනුගත කරන ලද ගබඩා තැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රථම විද්‍යාත්මක ගබඩා ආදර්ශනය දෙපාර්තමේන්තුව සතු වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ ඉදිකර අවසන් කිරීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

මේ වන විට එම ගබඩා ආදර්ශනයේ සහල් ගබඩා ගත කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, එලෙසින් අත්පත් කර ගත් ජයග්‍රහණ ආපස්සට යා නොදී තවදුරටත් ඉදිරියට ගමන් කරවීමේ උත්සාහයක් ලෙස 2013 වර්ෂයේදී එවන්වූ තවත් ගබඩාවක් වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ ඉදිකිරීම සඳහා වූ මූලික සැලසුම් අවසන් කර ඇත. මෙමගින් මිනිස් පාරිභෝජනයට සුදුසු හා ගුණාත්මක මට්ටමින් ආරක්ෂිත තොග කළමනාකරණය කිරීමේ පස් අවුරුදු වැඩ පිළිවෙළක් දෙපාර්තමේන්තුව හඳුනාගෙන ඇත.

එයිනුදු නොනැවතී සහල් හා ධාන්‍යයන්ගෙන් බැහැර වූ වෙනත් දේශීය වගා ද්‍රව්‍ය අතරින් බී ළූනු හා අර්තාපල් අල ආරක්ෂිත තොග වශයෙන් ගබඩා ගත කොට තබා ගැනීම සඳහා විද්‍යාත්මක

ක්‍රමවේදයන් ඔස්සේ විශේෂිත ගබඩා ආදර්ශන දෙකක් 2013 වසර අවසන් වීමට මත්තෙන් ඉදිකර අවසන් කිරීම දෙපාර්තමේන්තුවේ ඉදිරි අපේක්ෂාව වී ඇත.

දෙපාර්තමේන්තුව සතු ප්‍රීමා නිවාස සංකීර්ණයේ නිවාස කුලියට දීම හා අතිරික්ත ගබඩා කුලියට දීම තුලින් රජයේ ආදායම් වර්ධනය කරලීම සඳහා දායකත්වය සැපයීමද දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයට අයත් විය. ප්‍රවර්තන වර්ෂයේදී මෙන්ම ඉදිරි වසර වලදී ද කුලී ආදායම තුළින් රජයේ ආදායම වර්ධනය කරලීමට අපේක්ෂිතය.

මේ අන්දමින් ගුණාත්මක ආහාර ආරක්ෂිත තොග තැන්පත් කර තබාගැනීමත්, ඒ තුළින් හඳුනාගනු ලබන ආහාර අතිරික්තයන් අපනයන කරා යොමු කිරීමත්, රජයේ ආදායම් වර්ධනය සඳහා දායක වීමත් තළින් රජයේත්, මහජනතාවගේත් අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම දෙපාර්තමේන්තුවේ නිර්ව්‍යාජ අපේක්ෂාව වේ.



එන්. නිමල්කා ඩයස්

ආහාර කොමසාරිස්

2013 මාර්තු මස 25 වන දින

යූනියන් පෙදෙස,

කොළඹ 02,

ආහාර දෙපාර්තමේන්තුවේදීය.

# පටුන

1. ආහාර දෙපාර්තමේන්තුව දැක්ම මෙහෙවර……………07

2. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව - හැඳින්වීම……..08 - 11

3. සංවිධාන ව්‍යුහය - ආහාර දෙපාර්තමේන්තුව………….12

4. පාලන ව්‍යුහය හා කාර්යය මණ්ඩලය…………………13 - 16

5. විගණන හා විනය පාලන කටයුතු……………………17

6. අධිකරණමය කටයුතු……………………………18

7. දෙපාර්තමේන්තුව සතු ගබඩා සහ නිවාස……………..19 - 28

8. ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය…………..29 - 31

9. වත්කම් හා දේපල…………………………………32

10. ආදායම් සහ අයවැය……………………………..33

11. මූල්‍ය වාර්තා……………………………………34 - 36

12. ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය………………………..37 - 41

# (01). අප ගැන........

■ **දැක්ම**

“ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම”.

■ **මෙහෙවර**

“ධාන්‍යමය ආහාර ද්‍රව්‍යයන්හි වෙළඳපොළ සුලභතාව, පාරිභෝගිකයාට ළඟා වීමේ පහසුව සහ පාරිභෝගික මිලදී ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම උදෙසා ආහාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පාර්ශව, දෙපාර්තමේන්තුව සතු වත්කම් සහ කාර්යක්ෂමවූත්, කැපවූත් සේවක සමූහයා සමඟ මනා ලෙස සම්බන්ධීකරණය මගින් ආහාර දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම”.



# (02). ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

## හැඳින්වීම (1942-2012)

දෙවන වතාවටත් වෙඩි බෙහෙත් දුමාරයෙන් මුළු ලොවම වැසීගත් කාල වකවානුවෙහි සෑම රටක්ම පාහේ මුහුණදුන් පීඩනය ලංකාවේ අභ්‍යන්තර හා බාහිර කටයුතු කෙරෙහි ද බලපාන්නට විය. එයින් රටතුල පැවති වෙළඳාම අවිධිමත් විය. ආහාර බෙදා හැරීම රටපුරා සමානුපාතික අන්දමින් පවත්වාගෙන යාමට බාධා පැමුණුනි. ඒ හේතුවෙන් එම වකවානුව තුල ලංකා වාසී ජනතාව තම ආහාර සපයා ගැනීම පිළිබඳ විශාල ගැටළුවකට මුහුණ දෙමින් සිටියහ. මෙම පීඩනයෙන් ජනතාව මුදවා ගනු පිණිස රටපුරා සුගම අන්දමින් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම සඳහා පැන නැගුණු ගැටළු වලට විසඳුම් සෙවීමට පාලකයින් යුහුසුළු විය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් වසර 1941හි දී පාරිභෝගික අධිකාරිය නම් වූ ආයතනය බිහි කිරීමට කටයුතු කරනු ලැබූ රාජ්‍ය පාලකයෝ එමගින් ආහාර බෙදාහැරීම අඛණ්ඩවත්, සාධාරණවත් සිදුකිරීමේ වගකීම හා, ඒවායෙහි මිළ නියම කිරීම පිළිබඳ බලයත්, එම ආයතනය වෙත පවරන ලදී. එකී ආයතනය විසින් වසරකට ආසන්න කාලයක් මෙම කටයුත්ත ඉටුකරන ලද අතර එහි සුගමතාව පිළිබඳ ලත් අත්දැකීම් ආශ්‍රයෙන් මෙම කටයුත්ත සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම තුලින් දිගු කාලයක් පුරා මෙකී අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට හැකිවෙනු ඇතැයි අපේක්ෂාවෙන්, 1942 වර්ෂයේදී ආහාර දෙපාර්තමේන්තුව ස්ථාපිත කොට පාරිභෝගික අධිකාරිය සතුව තිබූ ආහාර ද්‍රව්‍ය ආනයන කිරීම, ගබඩා කිරීම, හා මිළ නියම කිරීම පිළිබඳ බල අධිකාරිය ආහාර දෙපාර්තමේන්තුවට පවරාදී ඉහත කී අවශ්‍යතා ඉටුකිරීම වෙනුවෙන් රාජ්‍ය නියෝජිතත්වය ලබාදීමට කටයුතු කෙරිණි. ඒ අනුව,

1942 වර්ෂය ආහාර දෙපාර්තමේන්තුවේ සමාරම්භක වසර විය. දෙපාර්තමේන්තු ප්‍රධානියා ආහාර කොමසාරිස්වරයා විය. එවකට ධූරය උසුලන ලද ආහාර කොමසාරිස් වරයා විසින් 1943 වසර වන තෙක් පාරිභෝගික අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් මැනවින් පවත්වාගෙන යමින් රටපුරා ආහාර බෙදාහැරීම සම්බන්ධයෙන් පැවැති ගැටළු සහගත තත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කරනු ලැබිණි.

1943 වර්ෂයේදී එවකට පැවති රජය විසින් ලංකාවාසී සියළු දෙනා වෙත රජයේ ප්‍රතිදානයක් ලෙස සහල් සළාකයක් ලබාදීමේ තීරණය අනුව ආරම්භ කරන ලද සහල් සළාක පත් නිකුත් කිරීමේ සහ ඒ සඳහා අවශ්‍ය සහල් සැපයීමේ කටයුතු ආහාර දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. මෙහිදී රටේ සෑම පුරවැසියකු වෙතම සහල් සළාක පතක හිමිකම ලබාදුන් අතර, එම සළාක පත්‍රයට හිමි සහල් පාරිභෝගිකයා වෙත ලබාදීමේ නියෝජිතයා වශයෙන් විවිධ සේවා සමූපකාර සමිති පත් කර ගැනීමට කටයුතු කරන ලදී. මූලික වශයෙන් සහල් සඳහා පමණක් සළාක පත් ලබාදුන් අතර, පසුව අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිහිපයක් සඳහා සළාක පත් නිකුත් කිරීම දක්වා එම මෙහෙවර පුළුල් විය.

1943 - 1979 දක්වා පැවැති සෑම රජයක් විසින්ම මෙම ප්‍රතිදානය ජනතාව වෙත ලබාදෙන ලද අතර මෙම කාලය පුරා ආහාර දෙපාර්තමේන්තුව විසින් රටෙහි ජනතාව වෙත වසරින් වසර මෙම සළාක පත් නිකුත් කිරීම හා ඒ සඳහා අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබාදීම සම්බන්ධයෙන් වූ මෙහෙවර අති සාර්ථක අයුරින් සිදු කරනු ලැබිණි. සළාකපත් වලට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබාදීම සඳහා විදේශයන්ගෙන් ගෙන්විය යුතු ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම, ගබඩා කිරීම, දෙපාර්තමේන්තුව සතු දිස්ත්‍රික් ගබඩා වෙත බෙදාහැරීම ආදී සියළු කටයුතු ආහාර දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අතර, මේ සඳහා අවශ්‍ය වූ වරාය ගුදම් හා ගුදම් වල සිට ගෙන එනු ලබන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා සංකීර්ණද, ප්‍රාදේශීය බෙදාහැරීම් කටයුතු සඳහා දිස්ත්‍රික් ගබඩා සෑම දිස්ත්‍රික්කයක් තුළම ප්‍රමාණවත් අන්දමින් පවත්වා ගෙන යන ලදී. මේ සඳහා යොදාගත් ගබඩාවන් අතරට දෙවන ලෝක සංග්‍රාමය පැවති අවධියේ එම යුධ අවශ්‍යතාවන් උදෙසා විවිධ වූ අවශ්‍යතාවන් සඳහා භාවිතයට ගනු පිණිස විදේශිකයින් විසින් තනන ලද ගොඩනැගිලි, ප්‍රතිසංස්කරණය කොට තම ගබඩාවන් ලෙස යොදා ගන්නා ලද අතර, අද වන විටද එම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතු ගබඩා වශයෙන් භාවිතයට ගනු ලැබේ. විශාල ධාරිතාවකින් යුතු වූත්, දිවයින පුරා විහිදුනු ගබඩා ජාලයකින් සමන්විත වූත්, මෙම දෙපාර්තමේන්තුව විශේෂිත වූ හා අත්‍යාවශ්‍ය කාර්යභාරයක නියැලෙමින් දිවයින පුරා ව්‍යාප්තවූ සේවාවක්

ලබාදෙමින් තම මෙහෙවර තුලින් කැපී පෙනෙන ස්ථරයකට පත්වන්නට සමත් වී තිබුනි. එසේම සෑම පළාතක් තුළම තම පරිපාලනය නිසි අයුරින් පවත්වාගෙන යාමේ අපේක්ෂාව පෙරදැරි කොටගෙන එම පළාත් වල දිසාපතිවරුන් සෘජුවම ආහාර කොමසාරිස් වරයාගේ පරිපාලන කටයුතු සඳහා දායක කර ගනිමින් දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාධනීය කර ගැනීම කටයුතු කර තිබේ. ඒ අනුව රටෙහි මූලික අවශ්‍යතාවයක් වූ ආහාර සම්පාදනය පුළුල් පරාසයක් තුල ක්‍රියාත්මක කරමින් දරණ ලද වගකීම මත, රටේ ප්‍රමුඛ පෙළේ දෙපාර්තමේන්තුවක් බවට පත්වීමටත්, A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ශ්‍රේණි ගතවීමටත් ඉඩ ප්‍රස්ථාව සැලසී ඇත.

මේ වන විට රටෙහි ජනගහන වර්ධන වේගයේ සීග්‍රතාවත් වාසී ජනගහනය විශාල වීමත් නිසා සියළුම ජනතාව වෙත නොමිලයේ ආහාර සළාකය ලබාදෙමින් අනිකුත් වැය ශීර්ෂයන් පවත්වාගෙන යාම දුෂ්කර කර්තව්‍යයක් වූ බැවින් හා පූර්ණ දරිද්‍රතාවයෙන් යුත් පුද්ගලයන්ට මෙන්ම සැළකිය යුතු ආර්ථික ශක්තියකින් හෙබි ඉහළ ආදායම්ලාභී පුද්ගලයින් වෙත මෙවැන්නක් ලබාදීමේ අවශ්‍යතාවයක් නොපවතින බව වටහාගත් රජය,

1979 වසර තුලදී එතෙක් පැවති සහල් සළාක පොත් ක්‍රමය ඉවත් කොට ඒ වෙනුවට දිළිඳු සහන මුද්දර ක්‍රමය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් සළාකපත් නිකුත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත තිබූ බලතල දිළිඳු සහන කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු කළ ද, දිළිඳු සහන මුද්දර සඳහා ලබාදිය යුතු ආහාර ද්‍රව්‍ය විවිධ සේවා සමූපකාර සමිති වෙත සැපයීම සහ ඒ සඳහා අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කිරීම තුලින් දෙපාර්තමේන්තුව ආරම්භක අවස්ථාවේදී පැවති අරමුණෙහි තවදුරටත් ඉදිරියට ගමන් කිරීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබිණි. මෙසේ ක්‍රියාත්මක වෙමින්,

1981 වසරේ ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව ඉදිකරන ලද ප්‍රිමා පිටි කම්හලෙහි නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමත් සමග එතෙක් සිදු කරන ලද තිරිඟු පිටි ආනයනය කොට බෙදා හැරීම නවතා දමා ඒ වෙනුවට තිරිඟු ඇට ගෙන්වා ප්‍රිමා ඇසුරුම් සංකීර්ණය තුළ පිටි නිෂ්පාදනය කොට එම නිෂ්පාදන බෙදාහැරීමේ ඒකාධිකාරය ආහාර දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ලදී.

1986 වන විට පිටි බෙදාහැරීමේ කාර්යයට අමතරව, ආහාර හා භූමිතෙල් මුද්දර සඳහා අවශ්‍ය සහල්, පිටි, සීනි, ආදී ආහාර ද්‍රව්‍ය සැපයීමේ කටයුත්ත දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කරගෙන යන ලද අතර එම ද්‍රව්‍ය සඳහා දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුදල්, දිළිඳු සහන දෙපාර්තමේන්තුව වෙතින් ආහාර දෙපාර්තමේන්තුව වෙත අයකර ගැනීමට කටයුතු කර ඇත. මෙලෙසින් අඩ සිය වසකට ආසන්න කාලයක් රටේ ජනතාවගේ ආහාර අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු වෙනුවෙන්, හා රජයේ අරමුණු සාක්ෂාත් කරලීම සඳහා ප්‍රමාණවත් වගකීමකින් යුත් පරිපූර්ණ දායකත්වයක් දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇත. එවකට පැවති රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත එතෙක් දෙපාර්තමේන්තුව වෙත පැවැති සීනි හා සහල් ගෙන්වීමේ අධිකාරි බලය පිළිවෙළින්,

1987 හා 1989 වර්ෂයන්හි දී පෞද්ගලික අංශය වෙත පැවරීම හේතුවෙන්, 1986 අගභාගයට එළඹෙත්ම රටවාසී ජනතාව වෙත ආහාර ද්‍රව්‍ය සැපයීමේ ඒකාධිකාරි රාජ්‍ය නියෝජිතයා වූ ආහාර දෙපාර්තමේන්තුව, අකර්මණ්‍ය වන තත්වයට පත්වන්නට විය. එනමුදු එක් කාර්ය භාරයක් ගිලිහී යාම සිය අරමුණින් බැහැර වීම සඳහා සාධක කොට නොගත් ආහාර දෙපාර්තමේන්තුව,

1990 වසරේදී සිය අධිකාරිය යටතට බොරැල්ල එලියට් පාරෙහි පිහිටි මුළුතැන්ගෙය හා බේකරි අංශය පවරා ගැනීමටත්, එමගින් බේකරි කර්මාන්තය නගා සිටුවීම සඳහාත්, දේශීය පිටි වර්ග යොදා පාන් නිෂ්පාදනය කිරීමත්, කොළඹ නගරය හා රාජ්‍ය ආයතන සඳහා පිසින ලද ආහාර සැපයීම සඳහාත් මූලිකත්වයක් දී කටයුතු කරනු ලැබ ඇත. මෙකී ක්‍රියාකාරිත්වයන් සමග වසර,

2000 වන විටත් දිවයින පුරා නිර්බාධිතව, ප්‍රිමා පිටි බෙදාහැරීමේ කාර්යය, දෙපාර්තමේන්තුව විසින් සාර්ථක අයුරින් පවත්වාගෙන යන ලදී. නමුත් වසර 20 ක ඇවෑමෙන් කම්හලෙහි හිමිකාරත්වය පෞද්ගලික අංශය වෙත ලබාදීම සඳහා රජය විසින් ගත් තීරණය හමුවේ,

1981 වසරේ සිට පුරා වසර 20ක් දෙපාර්තමේන්තුව සතුව අඛණ්ඩව පැවති පිටි බෙදාහැරීමේ ඒකාධිකාරය දෙපාර්තමේන්තුවෙන් ගිලිහී යන ලදී. එවන් වූ තත්වයක් අභිමුවෙහි මෙතෙක් දෙපාර්තමේන්තුව සතුව පැවති නිශ්චිත කාර්ය භාරයෙන් මදකට ඉවත්වූ ආහාර දෙපාර්තමේන්තුව තම අරමුණින් බැහැර වීමට ඉඩ නොතබා ආහාර බෙදාහැරීම සම්බන්ධයෙන් රජය විසින් අරමුණු කරනු ලබන කවර හෝ කාර්යයක නිමග්න වීම අපේක්ෂාවෙන් එතෙක් සිදු කරනු ලැබූ මෙහෙයුම් වලට සමගාමී වූ ගිණුම් කටයුතු අහවර කිරීමේ කටයුතුවල නිරත වන ලදී. වසර,

2002 හිදී බොරැල්ල එලියට් පාරෙහි පිහිටි මුළුතැන්ගෙය හා බේකරිය වසා දැමීමට රජය විසින් ගනු ලැබූ තීරණයක් අනුව මුළුතැන්ගෙය හා බේකරිය වසා දමා එහි පැවති දේපළ පර්ක් ආයතනයට පවරා දෙමින් යළිදු තම මෙහෙවරෙන් කොටසක් අත්හැර දමන්නට දෙපාර්තමේන්තුවට සිදුවිය.

1943 සිට 2002 දක්වා විවිධ වූ අරමුණු හා මෙහෙවරයන් යටතේ ක්‍රියාත්මක වන්නට දෙපාර්තමේන්තුවට සිදුවී ඇති නමුදු පවත්නා තත්වයන් යටතේ සාර්ථක ගමනක යෙදෙන්නට දෙපාර්තමේන්තුව සමත්වී ඇත. මේ තත්වය තුළ හැසිරෙන්නට දෙපාර්තමේන්තුවට සිදුවූ නමුදු ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සහතික වීම ආහාර දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වී තිබිණි. එම අරමුණින් බැහැර වීම වළක්වාලනු පිණිස හා හිඟයකින් තොරව ආහාර ද්‍රව්‍ය ලබාගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසා දීමක් වශයෙන් බන්ධිත ගුදම්කරුවන් දිරිමත් කිරීමට 2002 වසර තුළ කටයුතු කර ඇත.

2004 වර්ෂයේදී උක්ත මෙහෙවරයන් ඉටු කිරීම සඳහා භාවිතා කරන ලද ආහාර බෙදාහැරීමේ වාණිජ අත්තිකාරම් ගිණුම ඈවර කිරීම සඳහා දෙනු ලැබූ උපදෙස් පරිදි අදාළ ගිණුම ඈවර කිරීමට දෙපාර්තමේන්තුවට සිදුවිය. එම කාර්යයෙන් බැහැර වීමත්, රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ආහාර බෙදාදීමේ රජයේ වැඩ සටහන් තවදුරටත් ක්‍රියාත්මක නොකිරීමට රජය තීරණය කිරීම හේතුවෙන් යළිදු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ක්‍රමානුකූලව අඩුවෙමින් පැවතුණු අතර අමාත්‍යාංශයේ ලේකම්වරයා වැඩ බලන ආහාර කොමසාරිස් බවට පත්විය.

2005 වර්ෂය ආරම්භයේදී නැවතත් රජය මගින් ආරම්භකරන ලද සහතික මිල ක්‍රමය යටතේ වී මිළදී ගැනීමෙන් පසු ඒවා සහල් බවට පරිවර්තනය කොට එම සහල් ආහාර දෙපාර්තමේන්තුවට අයත් ගබඩාවල රැස්කිරීමේ කටයුතු පවත්වාගෙන යන්නට ආහාර දෙපාර්තමේන්තුවට සිදුවිය. මේ හේතුවෙන්,

2006 වසරේ, මැයි මස 25 දිනැති අමප/06/0901/218/025 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඈවර කිරීමට තීරණය කරන ලද ආහාර දෙපාර්තමේන්තුවේ කටයුතු ආරක්ෂිත තොග පවත්වාගෙන යාමට පමණක් සීමාවිය. මෙම කටයුත්ත සාර්ථකව පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන්,

2008 අගෝස්තු 11 දිනැති ටීඑම්සීසී/2008/18 අංක දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව නැවත ආහාර දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට යොජනා වූ අතර, එය ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු කළ අතර, එය 2008 සැප්තැම්බර් මස 04 දිනැති හා අමප/08/342/016 යටතේ අමප/0/1481/342/016 අංක දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් සම්මත වී ඇත. එයට සමගාමීව,

2009 වර්ෂයේ මැද භාගය වන විට නව ආහාර කොමසාරිස්වරියක පත්කිරීමත් සමග යළිදු වතාවක් දෙපාර්තමේන්තුව රජයේ අරමුණු ඉටු කිරීමේ කාර්යාවලියේ එක් පුරුකක් බවට පරිවර්තනය වන්නට විය. ඒ අනුව ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු වඩාත් විධිමත්ව ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා 146න් ගබඩා 123ක් හා ත්‍රිකුණාමළය ධාන්‍යගම චීන වරායේ පිහිටි නිවාස 366ක් ද ක්‍රියාකාරී මට්ටමින් රාජ්‍ය ආදායමට දායක කරලීමට දෙපාර්තමේන්තුව සමත් වූ අතර, මෙ.ටො.100,000ක ආරක්ෂිත තොගයක් පවත්වාගෙන යාමේ රජයේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ගබඩා 23ක් ස්වකීය භාරයේ තබා ගැනීමට දෙපාර්තමේන්තුව සමත්විය.

2010 වසර ආරම්භ වන විට පැවති රජය විසින් හඳුන්වාදෙනු ලැබූ මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුකූලව දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් පොහොර සහනාධාරය ලබාදීමෙන් ද කෘෂිකාර්මික යටිතල පහසුකම් වර්ධනය කිරීම මගින් හා ගොවියන් දිරිමත් කිරීම තුළින් ද එක් අඟලකුදු නොහැර සියළු කුඹුරු වගා කිරීමට ගොවියන් පෙළඹීම හේතුවෙන් වාර්තාගත වී අස්වැන්නක් ලැබිණ. නමුත් සාධාරණ මිළක් මත තම වී අස්වැන්න අලෙවි කර ගැනීමට ඇතිවූ බාධා හේතුවෙන්, රජය විසින් වී මිළදී ගැනීම සඳහා පනවන ලද සහතික මිළ යටතේ, ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් වී අලෙවි මණ්ඩලය හරහා වී මිළදී ගැනීමට කටයුතු කළ අතර එම වී ගබඩා කිරීම සඳහා අවශ්‍ය ගබඩා ඉඩකඩ ලබාදීමට ආහාර දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

2011 වසර ආරම්භයේදීම එම වී තොග වලින් නිෂ්පාදනය කරනු ලබන සහල් ආරක්ෂිත තොග, ආහාර දෙපාර්තමේන්තු ගබඩාවන්හි ගබඩා ගත කිරීමටත් කටයුතු කරන ලදී. ආරක්ෂිත තොග වශයෙන් තැන්පත් කරන ලද මෙකී සහල් තොග දිගු කාලයක් ගබඩා ගතකර තැබීමට සිදුවීම හේතුවෙන් එම ගබඩාවන්හි ඇතිවූ පලිබෝධ හානි අවම කර ගැනීම සඳහා රසායනික ද්‍රව්‍ය යෙදිය යුතුවිය. මේ තුළින් ලත් අත්දැකීම් අනුව ආහාර ද්‍රව්‍ය සඳහා රසායනික භාවිතය ඒවායෙහි ගුණාත්මක තත්වය පහත හෙළීමට බලපාන බවත්,

ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත්, අවම වශයෙන් හෝ ආසන්න වශයෙන් වර්ෂයක් තරම් වූ කාලයක් සහල් තොග රැස්කර තබා ගැනීම සඳහා පවත්නා ගබඩා හා භාවිත ක්‍රමවේදයන් නොගැලපෙන බව දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණය කරනු ලැබිණි. ඒ සඳහා සුදුසු ගබඩා තත්වයන් හා ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්නට මෙය විශාල පිටුවහලක් වූ අතර, දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ සඳහා භාවිත කළ හැකි ගබඩා තත්ව 04ක් හා විද්‍යාත්මක ක්‍රමවේද කිහිපයක් පිළිබඳව හෙළිදරව් කර ගැනීමට හැකිවිය.

ඒ අනුව ක්‍රියාත්මක වෙමින් 2012/2013 වර්ෂයන්හිදී එවන් ගබඩා ආදර්ශන 04 ඉදිකර ඒ සඳහා භාවිත කළහැකි විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය කිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනාවක් සකස් කොට අදාළ පාර්ශ්වයන් වෙත ඉදිරිපත් කොට එම අදියරයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය හා අරමුදල් සම්පාදනය කරගැනීමට අවශ්‍ය පියවරයන් ගැනීමට 2011 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.


එහෙත් 2012 වසර සඳහා යෝජිත ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සළසා දී නොතිබුණ බැවින් ලද ප්‍රතිපාදන ප්‍රමුඛතාවය පදනම් කොට ගනිමින් කළමනාකරණය කරන්නට සිදුවිය. මේ නිසා යාන්ත්‍රික වායු සංසරණ හා ස්වාභාවික වායු සංසරණ ගබඩා ආදර්ශනය යන දෙකෙහි ඉදිකිරීම්ද, ඊට අදාල විද්‍යාත්මක උපකරණ පද්ධති ගොඩනැගීම හා එම පද්ධති පාලනය සඳහා අවශ්‍ය මෙහෙයුම් කාර්යාලයෙහි ඉදිකිරීම් ද අවසන් කරන ලදී. එම ගබඩාවන්හි ගබඩා ගත කිරීමට අවශ්‍ය සහල් මිළදී ගැනීම සඳහා භාණ්ඩාගාරය වෙතින් ඉල්ලා සිටි ප්‍රතිපාදන නොලැබී ගිය නිසාවෙන් වාර්ෂික ඇස්තමේන්තුව මගින් ඇතැම් වැය විෂයයන් යටතේ සළසා දී තිබූ ප්‍රතිපාදන යටතේ දරණ ලද වියදම් විධිමත් ලෙස කළමනාකරණය කර ගනිමින් සහල් මෙ.ටො.1000 ක් ගබඩා ගත කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවිය. එම ප්‍රතිපාදන භාවිතයට ගනිමින් අදාල ගබඩාවන් තුළ සහල් ගබඩා ගත කිරීමේ කටයුතු වසර තුළදීම ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. ප්‍රවර්තන වර්ෂය මෙම අදියරයන් නිම කර ගැනීමෙහි ලා අභියෝගාත්මක වසරක් වූ නමුදු එම අභියෝගයන් නිසි ලෙස කළමනාකරණය කර ගැනීම මත වසර සඳහා තිබූ සියළු ඉලක්ක සපුරා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

එයිනුදු නොනැවතී ඉදිරි වර්ෂයේදී සහල් හා ධාන්‍ය වර්ගයන්ගෙන් බැහැර වූ දේශීය වගා ද්‍රව්‍ය අතරින් බී ළූනු හා අර්තාපල් ආරක්ෂිත තොග ගබඩා ගත කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගත කරන ලද ගබඩා ආදර්ශන දෙකක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමටත්, ඊට අදාල සැලසුම් සැකසීමටත් වර්ෂය තුළදී කටයුතු කර ඇත. ඊට සමගාමීව, සහල් ගබඩා කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගත කරන ලද තවත් ගබඩාවක්ද 2013 වසර තුලදී ඉදිකර අවසන් කිරීමට සැලසුම් සකසන ලදුව ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

මේ අනුව අවම පිරිවැයක් යටතේ දෙපාර්තමේන්තුව අපේක්ෂිත තත්වයන් සාධනය වන තත්වයට පවත්නා ගබඩා වැඩිදියුණු කිරීමටත්, ඒ තුලින් ආරක්ෂිත තොග පවත්වාගෙන යාම සාක්ෂාත් කරගැනීමත්, ඊට සමගාමීව දේශීය සහල් පාරිභෝජන අතිරික්තය හඳුනාගෙන එම අතිරික්තය අපනයනය සඳහා යොමු කිරීමටත් එම ඉලක්කය සපුරා ගනු වස්, කැපවීමෙන් යුතුව කටයුතු කිරීමත් දෙපාර්තමේන්තුවේ අනාගත අපේක්ෂාව වේ.



## (03). සංවිධාන ව්‍යුහය


ආහාර කොමසාරිස්
නියෝජ්‍ය ආහාර කොමසාරිස්
ප්‍රධාන ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර ආහාර කොමසාරිස්
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
තත්ත්ව පාලන නිලධාරී
වැඩ පරීක්ෂක
නීති අංශය
සැපයුම් අංශය
පාලන අංශය
ප්‍රවාහන අංශය
තොරතුරු තාක්ෂණ අංශය
තත්ත්ව පාලන අංශය
ගිණුම් අංශය

# (04). පාලන ව්‍යුහය හා කාර්යය මණ්ඩලය

## ■ පාලන ව්‍යුහය :

ආහාර කොමසාරිස් විසින් ක්‍රියාත්මක කළ පරිපාලන හා මෙහෙයුම් වැඩ සටහන්, ක්‍රියාකාරී අන්දමින් සිදුවෙමින් පැවතිණි.

2012 වසර සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම ගිණුම් කටයුතු, ගණකාධිකාරීවරිය විසින්ම සිදු කරන ලදි.

වේයන්ගොඩ, නාරහේන්පිට, ඔරුගොඩවත්ත ගබඩාවන් හා ත්‍රිකුණාමලය සහකාර ආහාර පාලක කාර්යාලය යන ස්ථාන සඳහා ස්ථාන භාර නිලධාරීන් පත් කර තිබූ අතර ධාන්‍ය සමීක්ෂකවරයා සේවයෙන් මුදා හැරීමට සිදුවීම මත නාරාහේන්පිට තත්ත්ව පාලන ඒකකය ද ස්ථාන භාර නිලධාරී යටතේ ක්‍රියාත්මක කිරීමට සිදුවිය.

රාජ්‍ය කළමනාකරණ සහකාර අධිශ්‍රේණියේ සිටින එකම නිලධාරිනිය, වැඩ බැලීමේ පදනම මත පරිපාලන නිලධාරී ලෙස සේවය කරන ලදි.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අනුමත තනතුරු 82 සඳහා I, II, III පංතිවලට අයත් නිලධාරි මහත්ම මහත්මීන් 42 දෙනෙකු ද විවිධ තනතුරුවලට අයත් අනුමත දෙපාර්තමේන්තු ගත සේවක තනතුරු 108 සඳහා සේවකයින් 71 දෙනෙකු ද ඇතුළුව මුළු අනුමත සේවක සංඛ්‍යාව වූ 229 සඳහා 2012.12.31 දිනට කාර්යය මණ්ඩලයේ 137 දෙනෙකු සේවයේ යෙදී ඇත.


2012.01.01 දිනට සේවයේ සිටි මුළු සේවක සංඛ්‍යාවෙන් 9% ක් වසර තුළදී විශ්‍රාම ලැබීමත්, රියදුරු සේවය සඳහා නව පත්වීම් 2ක් බඳවා ගැනීමත් විශේෂයෙන් දැක්විය හැක.



■ 2012 ආහාර දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය

| # | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2012.12.31 දිනට සේවයේ නියුතු |
|---|---|---|---|
| 01 | ආහාර කොමසාරිස් | 01 | 01 |
| 02 | නියෝජ්‍ය ආහාර කොමසාරිස්/ සහකාර ආහාර කොමසාරිස් | 02 | 01 |
| 03 | ගණකාධිකාරි | 02 | 01 |
| 04 | පරිපාලන නිලධාරි | 01 | 01 (වැඩ බැලීමේ පදනම මත) |
| 05 | භාෂා පරිවර්තක | 01 | - |
| 06 | තත්ත්ව පාලන නිලධාරී | 01 | - |
| 07 | ධාන්‍ය සමීක්ෂක | 01 | – |
| 08 | වැඩ පරීක්ෂක | 01 | 01 |
| 09 | තොරතුරු හා සන්නිවේදන සහකාර | 01 | – |
| 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 82 | 42 |
| 11 | වාප්පු ක්ෂේත්‍ර සේවය | 10 | 08 |
| 12 | රියදුරු | 10 | 08 |
| 13 | කාර්යාල සේවක සේවය | 22 | 12 |
| 14 | ධූමායනකරු (යන්ත්‍ර ක්‍රියාකරු/කම්කරු) | 26 | 21 |
| 15 | රිය සහකරු | 02 | 13 |
| 16 | වාප්පු ක්ෂේත්‍ර කම්කරු | 01 | 01 |
| 17 | මුරකරු | 41 | 27 |
| 18 | ගබඩා කම්කරු | 24 | – |
| | | | |
| එකතුව | | **229** | **137** |

- 2012 ආහාර දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව



## I. නව පත්වීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 |

## II. නව බඳවා ගැනීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | රියදුරු සේවය | 02 |

## III. විශ්‍රාම ගැන්වීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | කළමනාකරණ සහකාර සේවය | 03 |
| II. | වාප්පු ක්ෂේත්‍ර නිලධාරී | 01 |
| III. | කාර්යාල කාර්ය සහයක | 01 |
| IV. | ධූමායන යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| V. | මුරකරු | 07 |

## IV. ස්ථාන මාරු වී යෑම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | කළමනාකරණ සහකාර සේවය | 03 |

## V. ස්ථාන මාරු වී පැමිණීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| II. | කළමනාකරණ සහකාර සේවය | 03 |

## VI. දෙපාර්තමේන්තු සේවයෙන් මුදා හැරීම්

*(විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 48(අ))*

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| I. | ධාන්‍ය සමීක්ෂක | 01 |

# (05). විගණන හා විනය පාලන කටයුතු

## ■ විගණනය :

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන කාර්යය මණ්ඩලයෙන් සමන්විත විගණන ශාඛාවක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇත. එමගින් අවශ්‍ය අවස්ථාවන්හි දි කරනු ලබන විගණනයන්ට අමතරව අවසන් ගිණුම් විගණන කටයුතු ද සිදු කෙරේ.

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් මෙහෙයවනු ලැබූ අතර විගණකාධිපතිවරයා විසින් හා දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටි, රජයේ විගණන අංශය වෙතින් එවනු ලබන විගණන විමසුම් සඳහා වන පිළිතුරු අමාත්‍යංශය වෙත පිටපත් සහිතව අදාළ පාර්ශ්වයන් වෙත ඍජුවම යැවීමට කටයුතු කර ඇත.

ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත 2012 වසරේ දී විගණන විමසුම් 26 ක් ලැබුණු අතර ඉන් 25 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

## ■ විනය පාලන කටයුතු :

2012 වර්ෂයේදී එක් ගබඩා භාරකාර මහතකු සඳහා පමණක් විනය පරීක්ෂණයක් පැවැත්වීමට සිදුවීම ආයතන පාලනයේ විධිමත්භාවය ඇගයෙන විශේෂ කරුණක් ලෙස දැක්විය හැක.



# (06). අධිකරණමය කටයුතු

2012 වසරේ අවසානය වන විට ආහාර දෙපාර්තමේන්තුව විසින් පවරා තිබූ නඩු අතුරින් දිසා/මහේස්ත්‍රාත් අධිකරණ වල විභාග වෙමින් පැවති නඩු ගණන 10 කි.

| # | නඩු වර්ගය | විභාග වන්නාවූ නඩු |
|---|---|---|
| I. | අගරු චෙක්පත් මුදල් අයකර ගැනිම | 01 |
| II. | හිඟ ගබඩා කුලී අය කර ගැනීම | 05 |
| III. | ගබඩා සන්තකය ලබාගැනීම | 01 |
| IV. | අධිභාර අයකර ගැනීම | 03 |
| | **එකතුව** | **10** |

| # | අධිකරණය | නීතිමය පියවර ගැනීම ඇරඹූ |
|---|---|---|
| I. | ත්‍රිකුණාමලය ධාන්‍යගම නිවාසවල නොගෙවූ හිඟ කුලී අය කර ගැනීම හා සන්තකය ආපසු ගැනිමට නීතිමය පියවර ගැනීම ආරම්භ කළ සංඛ්‍යාව (අස්කිරීමේ නිවේදන යවන ලද) | 36 |
| | **එකතුව** | **36** |

| | | |
|---|---|---|
| | **මුළු එකතුව** | **46** |

තවද රජයේ දේපළ ණය නැවත නොගෙවූ දෙපාර්තමේන්තුවේ සේවය කළ සේවකයින් සිවු දෙනකු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ අදාළ නෛතික කටයුතු සිදු කිරීමත් 2012 වසර තුළ සිදු කරන ලදී.

# (07). දෙපාර්තමේන්තුව සතු ගබඩා සහ නිවාස

## ■ දෙපාර්තමේන්තුව සතු ගබඩා :

ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා දිස්ත්‍රික්ක 25ක පිහිටා ඇති අතර සංඛ්‍යාත්මකව එය 147කි. රාජ්‍ය දේපළ මනාව කළමනාකරණය කිරීමේ අදහසින් එම දේපළ පහත පරිදි කාර්යයන්හි යොදවා ඇත.

| # | ගබඩා | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත කුලියට ලබා දීම | 55 |
| 2. | තාවකාලික/කුලී රහිත පදනම මත රාජ්‍ය අංශයේ ආයතන වෙත ලබා දී ඇති ගබඩා | 43 |
| 3. | දැනට ආහාර දෙපාර්තමේන්තුව භාරයේ ඇති ගබඩා | 30 |
| 4. | දිස්ත්‍රික් ලේකම්/ප්‍රා.ලේකම් භාරයේ ඇති ගබඩා | 15 |
| 5. | රාජ්‍ය ආයතන වෙත පැවරීමට නියමිත ගබඩා | 3 |
| 6. | ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් විනාශ වූ ගබඩා | 1 |
| | **එකතුව** | **147** |

## ■ දෙපාර්තමේන්තුව සතු නිවාස :

ආහාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිවාස 366ක් ත්‍රිකුණාමලයේ, චීනවරායේ, ධාන්‍යගම පිහිටා ඇත. එම නිවාස පහත සඳහන් පරිදි කුලියට දී ඇත.

| # | 2012.12.31 දිනට බාරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ප්‍රීමා සිලෝන් සමාගම | 206 |
| 2. | රජයේ සේවයේ නියුතු නිලධාරීන් හා සේවකයින් | 152 |
| 3. | දෙපාර්තමේන්තුව භාරයේ | 08 |
| | **එකතුව** | **366** |

## ❖ ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා විස්තරය

2012.12.31 දිනට දෙපාර්තමේන්තුව භාරයේ හා දැනට කුලී රහිතව හෝ කුලියට දී ඇති ගබඩා සම්බන්ධ වාර්තාව පහත දක්වා ඇත.

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය | තක්සේරුගත මාසික කුලිය රු. (නව) |
|---|---|---|---|---|---|
| **කොළඹ දිස්ත්‍රික්කය - *ඔරුගොඩවත්ත*** | | | | | |
| 01 | ඔරුගොඩවත්ත - 01 | 24624 | 6000 | ශ්‍රී ලංකා රේගුව | 365,000/- |
| 02 | ඔරුගොඩවත්ත - 02 | 24624 | 6000 | පුනරුත්තාපන අමාත්‍යංශය | තාවකාලික පදනම මත කුලී රහිතව ලබා දී ඇත |
| 03 | ඔරුගොඩවත්ත - 03 | 20304 | 5000 | අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 365,000/- |
| 04 | ඔරුගොඩවත්ත - 04 | 19008 | 5000 | පුනරුත්තාපන අමාත්‍යංශය | තාවකාලික පදනම මත කුලී රහිතව ලබා දී ඇත |
| 05 | ඔරුගොඩවත්ත - 05 | 19008 | 4500 | අයිකොන් ඩිස්ට්‍රිබියුටර්ස් | 290,000/- |
| 06 | ඔරුගොඩවත්ත - 06 | 20304 | 5000 | උසස් අධ්‍යාපන අමාත්‍යංශය | 310,000/- |
| 07 | ඔරුගොඩවත්ත - 07 | 20304 | 5000 | ආපදා සහන දෙපාර්තමේන්තුව | තාවකාලික පදනම මත කුලී රහිතව ලබා දී ඇත |
| 08 | ඔරුගොඩවත්ත - 08 | 16560 | 4000 | උසස් අධ්‍යාපන අමාත්‍යංශය | 265,000/- |
| 09 | ඔරුගොඩවත්ත - 09 | 16560 | 4000 | පුනරුත්තාපන අමාත්‍යංශය | තාවකාලික පදනම මත කුලී රහිතව ලබා දී ඇත |
| 10 | ඔරුගොඩවත්ත - 12 | 18183 | 4000 | ශ්‍රී ලංකා රේගුව | 257,500/- |
| 11 | ඔරුගොඩවත්ත - 10 | 13436 | - | ඊන්ක් කන්ටේනර්ස් ටර්මිනල්ස් (පුද්.) සමාගම | 2,465,000/- |
| 12 | ඔරුගොඩවත්ත - 14 | 11448 | - | | |
| 13 | ඔරුගොඩවත්ත - 15 | 18206 | - | | |
| 14 | ඔරුගොඩවත්ත - 16 | 19838 | - | | |
| 15 | කාර්යාල ගොඩනැගිල්ල | - | - | | |
| | **එකතුව** | **262407** | **48500** | | **4,317,500/-** |
| **කොළඹ දිස්ත්‍රික්කය - *නාරාහේන්පිට*** | | | | | |
| 16 | නාරාහේන්පිට - 01 | 10092 | 2110 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 17 | නාරාහේන්පිට - 02 | 10092 | 2150 | | |
| 18 | නාරාහේන්පිට - 03 | 3583 | 700 | මොඩර්න් ඩිස්ට්‍රිබියුටර්ස් | 160,000/- |
| 19 | නාරාහේන්පිට - 04 | 10135 | 2110 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 20 | නාරාහේන්පිට - 05 | 10135 | 2150 | | |
| 21 | නාරාහේන්පිට - 06 | 10135 | 2150 | | |
| 22 | නාරාහේන්පිට - 07 | 9740 | - | ආර්ථික මධ්‍යස්ථානය | - |
| 23 | නාරාහේන්පිට - 08 | 28080 | 5700 | | |
| 24 | නාරාහේන්පිට - 09 ඒ | 10000 | 4150 | දෙරණ ආයතනය | 475,000/- |
| 25 | නාරාහේන්පිට - 09 බී | 10000 | 2600 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 26 | නාරාහේන්පිට - 10 | 15000 | 2600 | එනර්ජි කොමර්ස් බීවී | 515,000/- |
| 27 | නාරාහේන්පිට - 11 | 23850 | 5000 | ආර්ථික මධ්‍යස්ථානය | - |
| 28 | නාරාහේන්පිට - 12 | 12992 | 2700 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| | **එකතුව** | **163834** | **34120** | | **1,150,000/-** |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය | තක්සේරුගත මාසික කුලිය රු. (නව) |
|---|---|---|---|---|---|
| **කොළඹ දිස්ත්‍රික්කය - *බාන්ස් පෙදෙස*** | | | | | |
| 29 | බාන්ස් පෙදෙස ලේඛනාගාරය | - | 5000 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 30 | බාන්ස් පෙදෙස කාර්යාලය | - | 2300 | මහපොළ ට්‍රස්ට් ෆන්ඩ් | 85,000/- |
| 31 | බාන්ස් පෙදෙස කාර්යාලය | - | 19362 | සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව | - |
| 32 | එම | - | - | | - |
| 33 | එම | - | - | | - |
| 34 | එම | - | - | | - |
| 35 | එම | - | - | | - |
| | **එකතුව** | **-** | **26662** | | **85,000/-** |
| **කොළඹ දිස්ත්‍රික්කය - *රත්මලාන*** | | | | | |
| 36 | රත්මලාන - 01 | 50350 | 8530 | ආර්ථික මධ්‍යස්ථානය | - |
| 37 | රත්මලාන - 03 | 41200 | 7520 | රතු කුරුස සමාජය | තාවකාලික පදනම මත කුලී රහිතව ලබා දී ඇත |
| 38 | රත්මලාන - 04 | 19032 | 2580 | ආර්ථික මධ්‍යස්ථානය | |
| 39 | රත්මලාන - 05 | 21008 | 2900 | කම්කරු දෙපාර්තමේන්තුව | අ.ම.තී. අනුව වසර 33 කට කුලී රහිතව දී ඇත. |
| | **එකතුව** | **131590** | **21530** | | |
| **කොළඹ දිස්ත්‍රික්කය - *වැල්ලවත්ත*** | | | | | |
| 40 | වැල්ලවත්ත - 01 | 10266 | 2000 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | - |
| 41 | වැල්ලවත්ත - 02 | 10915 | 2000 | | - |
| 42 | වැල්ලවත්ත - 03 | 11100 | 2000 | | - |
| 43 | වැල්ලවත්ත - 04 | 11100 | 2000 | ශ්‍රී ලංකා නාවික හමුදාව | - |
| | | **43381** | **8000** | | - |
| **කොළඹ දිස්ත්‍රික්කය** | | | | | |
| 44 | හුණුපිටිය කාර්යාල කාමරය | 755 | - | සුනීතා ගුණසිංහ මිය | 2,800/- |
| | **එකතුව** | **755** | **-** | | **2,800/-** |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය | තක්සේරුගත මාසික කුලිය රු. (නව) |
|---|---|---|---|---|---|
| **ගම්පහ දිස්ත්‍රික්කය - *වේයන්ගොඩ*** | | | | | |
| 45 | වේයන්ගොඩ - 01 | 29040 | 5900 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 46 | වේයන්ගොඩ - 02 | 21750 | 4000 | ඒබල් හොල්ඩින්ස් (පුද්.) සමාගම | 70,000/- |
| 47 | වේයන්ගොඩ - 03 | 6142 | 1200 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 48 | වේයන්ගොඩ - 04 | 7552 | 900 | බණ්ඩාර ඉන්ඩස්ට්‍රියල් සර්විසස් | 23,000/- |
| 49 | වේයන්ගොඩ - 05 | 12373 | 1400 | සංස්කෘතික කටයුතු දෙපා. | 40,000/- |
| 50 | වේයන්ගොඩ - 06 | 7568 | 1100 | බුද්ධ ශාසන අමාත්‍යංශය | තාවකාලික පදනම මත කුලී රහිතව ලබා දී ඇත |
| 51 | වේයන්ගොඩ - 07 | 28860 | 5400 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 52 | වේයන්ගොඩ - 08 | 28860 | 5400 | | - |
| 53 | වේයන්ගොඩ - 09 | 28860 | 5400 | | - |
| 54 | වේයන්ගොඩ - 10 | 28860 | 5400 | | - |
| 55 | වේයන්ගොඩ - 11 | 33200 | 6200 | දොන් මියොන් ආයතනය | සන්තකය භාර ගැනීමට නීති මගින් ක්‍රියා කරයි |
| 56 | වේයන්ගොඩ - 12 | 33200 | 5560 | ආර්ථික මධ්‍යස්ථානය | - |
| 57 | වේයන්ගොඩ - 13 | 24288 | 6800 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 58 | වේයන්ගොඩ - 14 | 5368 | 860 | ප්‍රා.ලේ (අත්තනගල්ල) | - |
| 59 | වේයන්ගොඩ - 16 | 6370 | 1200 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 60 | වේයන්ගොඩ - 17 | 6279 | 770 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය | 17,500/- |
| | **එකතුව** | **308570** | **57490** | | **150,500/-** |
| **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | | |
| 61 | නිකවැරටිය ගබඩාව | 10496 | 4000 | ප්‍රා.ලේ (නිකවැරටිය) | - |
| 62 | අස්වැද්දුම ගබඩාව | 6132 | - | වයඹ පළාත් සභාව | - |
| 63 | මහව අංක - 01 | 4698 | 800 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 64 | මහව අංක - 02 | 13118 | 1300 | | - |
| 65 | මල්කඩුවාව අංක - 01 | 5227 | 2000 | ෂෙයිඩ් මොහොමඩ් සමාගම | 34,787.50 |
| 66 | මල්කඩුවාව අංක - 02 | 4827 | 2000 | | 24,462.50 |
| 67 | මල්කඩුවාව අංක - 03 (GI) ගබඩාව | 10498 | 2000 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 68 | ගැට්ටුවාන අංක - 01 | - | - | වී අලෙවි මණ්ඩලය | 50,000/- |
| 69 | ගැට්ටුවාන අංක - 02 | 6336 | 2000 | සෙලින් එක්ස්පෝර්ට් | - |
| 70 | ගැට්ටුවාන අංක - 03 | 5544 | 2000 | ස.තො.ස | - |
| 71 | ගැට්ටුවාන අංක - 04 | 5544 | 2000 | | - |
| | **එකතුව** | **72420** | **18100** | | **109,250/-** |


| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය | තක්සේරුගත මාසික කුලිය රු. (නව) |
|---|---|---|---|---|---|
| මහනුවර දිස්ත්‍රික්කය | | | | | |
| 72 | පල්ලෙකැලේ | 15484 | 1500 | ඩබ්ලිව්.එස්.ආර් විජේසිරි | 150,000/- |
| 73 | කටුගස්තොට ගබඩාව | 6490 | 1700 | ට්‍රෙන්ඩ්ස් මාර්කටින් | 120,000/- |
| 74 | වත්තේගම ගබඩාව | 5120 | 1000 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| | **එකතුව** | **27094** | **4200** | | **270,000/-** |
| කෑගල්ල දිස්ත්‍රික්කය | | | | | |
| 75 | කෑගල්ල - පරගම්මන 01 | 5500 | 1500 | විජිත ග්‍රෑප් කම්පැණි ලිමිටඩ් | 85,000/- |
| 76 | කෑගල්ල - පරගම්මන 02 | 5500 | 1500 | | |
| 77 | කෑගල්ල - පරගම්මන 03 | 3960 | - | | |
| | **එකතුව** | **14960** | **3000** | | **85,000/-** |
| ගාල්ල දිස්ත්‍රික්කය | | | | | |
| 78 | බූස්ස අංක - 02 | 23721 | 3750 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 79 | බූස්ස අංක - 03 | 23721 | 3750 | | - |
| 80 | බූස්ස අංක - 04 | 56784 | 6000 | ආර්ථික මධ්‍යස්ථානය | - |
| 81 | බූස්ස අංක - 05 | 55770 | | | - |
| 82 | කටුගොඩ අංක - 01 | 20545 | 3825 | ට්‍රයිකෝ මෙරිටයිම් | 61,500/- |
| 83 | කටුගොඩ අංක - 02 | 9532 | 1775 | | 38,500/- |
| 84 | කොග්ගල ගබඩාව | 5000 | 925 | හබරාදූව ප්‍රාදේශීය ලේකම් | - |
| | **එකතුව** | **195073** | **14025** | | **100,000/-** |
| මාතර දිස්ත්‍රික්කය | | | | | |
| 85 | මැද්දවත්ත අංක - 01 | 7264 | 965 | වී අලෙවි මණ්ඩලය | - |
| 86 | මැද්දවත්ත අංක - 02 | 10000 | 1870 | දිස්ත්‍රික් ලේකම් (මාතර) | - |
| 87 | මැද්දවත්ත අංක - 03 | 5755 | 900 | ශ්‍රී ලංකා පාරිභෝගික ස.ස | 10,000/- |
| 88 | වැලිගම ගබඩාව | 8019 | 1300 | පියසිරි ස්ටෝර්ස් | 38,500/- |
| | **එකතුව** | **31038** | **5035** | | **48,500/-** |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | | | | | |
| 89 | හම්බන්තොට ගබඩාව | 14023 | 4500 | වී අලෙවි මණ්ඩලය | - |
| 90 | වීරවිල අංක - 01 | 5478 | 1700 | ප්‍රා.ලේ (හම්බන්තොට) | - |
| 91 | වීරවිල අංක - 02 | 4157 | 1100 | | |
| 92 | වීරවිල අංක - 03 | 4221 | 1700 | | |
| 93 | කහඳාව අංක - 01 | 3517 | 1900 | වී අලෙවි මණ්ඩලය | කුලී රහිතව ලබා දී ඇත |
| 94 | කහඳාව අංක - 02 | 4090 | 1900 | | |
| | **එකතුව** | **35486** | **12800** | | - |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය | තක්සේරුගත මාසික කුලිය රු. (නව) |
|---|---|---|---|---|---|
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | | |
| 95 | ශ්‍රාවස්තිපුර අංක - 01 | 25520 | 3575 | වී අලෙවි මණ්ඩලය | - |
| 96 | ශ්‍රාවස්තිපුර අංක - 02 | 23930 | 3350 | | |
| 97 | කැකිරාව අංක - 01 | 7950 | 1275 | වී අලෙවි මණ්ඩලය | - |
| 98 | කැකිරාව අංක - 02 | 7150 | 1145 | | |
| 99 | සේනානායක අංක - 01 | 2461 | 390 | සී/ස ජනතා ඒකාබද්ධ ගොවි සමා. | 15,000/- |
| 100 | සේනානායක අංක - 02 | 2461 | 396 | දේශීය වෛද්‍ය අමාත්‍යංශය | - |
| 101 | සේනානායක අංක - 03 | 11017 | 2400 | වී අලෙවි මණ්ඩලය | - |
| 102 | සේනානායක අංක - 04 | 2185 | 325 | සී/ස ජනතා ඒකාබද්ධ ගොවි සමා. | 15,000/- |
| | **එකතුව** | **82674** | **12856** | | **30,000/-** |
| **පොලොන්නරුව දිස්ත්‍රික්කය** | | | | | |
| 103 | කදුරුවෙල අංක - 01 | 13419 | 2880 | වී අලෙවි මණ්ඩලය | - |
| 104 | කදුරුවෙල අංක - 02 | 20187 | 3200 | වී අලෙවි මණ්ඩලය | කුලී රහිතව ලබා දී ඇත |
| 105 | හිඟුරක්ගොඩ අංක - 01 | 23550 | 4400 | ස.තො.ස | කුලී රහිතව ලබා දී ඇත |
| 106 | හිඟුරක්ගොඩ අංක - 02 | 23550 | 4400 | | කුලී රහිතව ලබා දී ඇත |
| | **එකතුව** | **80706** | **14880** | | **-** |
| **නුවරඑළිය දිස්ත්‍රික්කය** | | | | | |
| 107 | බ්ලැක්පූල් අංක - 01 | 1514 | 280 | නුවරඑළිය කෘෂිකාර්මික සමුපකාර සමිතිය | 16,000/- |
| 108 | බ්ලැක්පූල් අංක - 02 | 1836 | 150 | | 8,500/- |
| 109 | බ්ලැක්පූල් - 02 ඉහළ මහළ | 1824 | - | | |
| 110 | බ්ලැක්පූල් අංක - 03 | 2335 | 435 | | 13,500/- |
| | **එකතුව** | **7509** | **865** | | **38,000/-** |
| **රත්නපුර දිස්ත්‍රික්කය** | | | | | |
| 111 | රත්නපුර ගබඩාව | 9611 | 1800 | සී/ස බඹරබොටුව මාරපන වි.සේ.ස | 50,000/- (රු.2000/- ක නාමික කුලියක් ගෙවයි). |
| 112 | ඕපනායක අංක - 01 | 7730 | 1335 | ලාල් ස්ටෝර්ස් | 60,000/- |
| 113 | ඕපනායක අංක - 02 | 5300 | 850 | විදුලිබල මණ්ඩලය | 30,000/- |
| 114 | ඇහැළියගොඩ අංක - 01 | 2337 | 435 | සී/ස ඇහැළියගොඩ වි.සේ.ස | 8157.60/- |
| 115 | ඇහැළියගොඩ අංක - 02 | 2373 | 435 | | 31928.50/- |
| 116 | ඇහැළියගොඩ අංක - 03 | 4806 | 900 | | |
| 117 | කහවත්ත අංක - 01 | 3180 | 590 | සී/ස පන්නිල්පත්තු වි.සේ.ස | 17,500/- |
| 118 | කහවත්ත අංක - 02 | 1881 | 150 | | |
| | **එකතුව** | **37218** | **6495** | | **197,586.10/-** |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය | තක්සේරුගත මාසික කුලිය රු. (නව) |
|---|---|---|---|---|---|
| **මොණරාගල දිස්ත්‍රික්කය** | | | | | |
| 119 | මොණරාගල අංක 01 | 22480 | 3150 | වී අලෙවි මණ්ඩලය | තාවකාලිකව |
| 120 | මොණරාගල අංක - 02 | 7000 | 1250 | ස.තො.ස | - |
| | **එකතුව** | **29480** | **4400** | | **-** |
| **මාතලේ දිස්ත්‍රික්කය** | | | | | |
| 121 | මාතලේ අංක - 01 | 21448 | 3000 | මොහොමඩ් අෂ්රොෆ් මයා | 45,000/- |
| | **එකතුව** | **21448** | **3000** | | **45,000/-** |
| **බදුල්ල දිස්ත්‍රික්කය** | | | | | |
| 122 | බදුල්ල අංක - 01 | 7245 | 1380 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 123 | බදුල්ල අංක -02 | 6781 | 1500 | ශ්‍රී ලංකා පාරිභෝගික ස.ස විදුලිබල මණ්ඩලය | 16,953/- |
| 124 | හපුතලේ අංක - 01 | 1653 | 130 | හපුතලේ වි.සේ.ස | 17,500/- |
| 125 | හපුතලේ අංක - 02 | 1806 | 120 | | |
| | **එකතුව** | **17485** | **3130** | | **34,453/-** |
| **අම්පාර දිස්ත්‍රික්කය** | | | | | |
| 126 | අම්පාර අංක - 01 | 11368 | 2125 | ආහාර දෙපාර්තමේන්තුව | - |
| 127 | අම්පාර අංක - 02 | 11368 | 2125 | වී අලෙවි මණ්ඩලය | කුලී රහිතව ලබා දී ඇත |
| | **එකතුව** | **22736** | **4250** | | **-** |
| **මඩකලපුව දිස්ත්‍රික්කය** | | | | | |
| 128 | මඩකලපුව අංක - 01 | 18000 | 6000 | දි..ලේ (මඩකලපුව) | - |
| 129 | මඩකලපුව අංක - 03 | 17600 | 6000 | | - |
| 130 | මඩකලපුව අංක - 02 | 17600 | 6000 | වී අලෙවි මණ්ඩලය | කුලී රහිතව ලබා දී ඇත |
| 131 | මඩකලපුව අංක - 04 (දුම්රිය පොළ අසළ ගබඩාව) | 13560 | 2800 | ස.තො.ස දිස්ත්‍රික් ලේකම් (මඩලපුව) | - |
| | **එකතුව** | **66760** | **20800** | | **-** |


| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය | තක්සේරුගත මාසික කුලිය රු. (නව) |
|---|---|---|---|---|---|
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | | |
| 132 | පුත්තලම අංක - 01 | 5600 | 600 | දි.ලේ (පුත්තලම) | - |
| 133 | පුත්තලම අංක - 02 | 9600 | 1000 | | - |
| | **එකතුව** | **15200** | **1600** | | **-** |
| **වව්නියාව දිස්ත්‍රික්කය** | | | | | |
| 134 | වව්නියාව අංක - 01 | 3763 | 775 | ස.තො.ස ආයතනය | කුලී රහිතව ලබා දී ඇත |
| 135 | වව්නියාව අංක - 02 | 4165 | 165 | දි.ලේ (වව්නියාව) | - |
| 136 | වව්නියාව අංක - 03 | 684 | 160 | | - |
| | **එකතුව** | **8612** | **1100** | | **-** |
| **ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය** | | | | | |
| 137 | ලව්ලේන් සැ.ම (ගබඩා 05 යි.) | 28518 | 15000 | ගබඩා 03 ක් - නිවාස සංවර්ධන අධිකාරිය ගබඩා 02 ක් - ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය | - |
| 138 | ක්ලැපන්බර්ග් දිසා ධාන්‍යාගාරය | - | 66200 | යුධ හමුදාව | - |
| | **එකතුව** | **94718** | **15000** | | **-** |
| **යාපනය දිස්ත්‍රික්කය** | | | | | |
| 139 | යාපනය (ගබඩා 02 යි.) | - | - | ත්‍රස්ථවාදී කටයුතු හේතුවෙන් ගබඩා සම්පූර්ණයෙන් විනාශ වී ඇත. | - |
| 140 | කන්කසන්තුරේ (ගබඩා 05) | 80800 | 14625 | ආරක්ෂක අමාත්‍යංශය විසින් පරිහරණය කරයි. | - |
| 141 | නාවක්කුලි (ගබඩා 03) | 43200 | 7500 | දිස්ත්‍රික් ලේකම් (යාපනය) | - |
| 142 | පේදුරුතුඩුව (ගබඩා 03) | 8709 | 2625 | ආරක්ෂක අමාත්‍යංශය | - |
| 143 | කයිට්ස් | 1702 | 375 | කයිට්ස් වි.සේ.ස.සමිතිය විසින් පරිහරණය කරයි. | - |
| | **එකතුව** | **134411** | **25125** | | **-** |
| **මන්නාරම දිස්ත්‍රික්කය** | | | | | |
| 144 | මන්නාරම | 4356 | 450 | දිස්ත්‍රික් ලේකම් (මන්නාරම) | - |
| 145 | මුරුන්කන් | 9720 | 1500 | දිස්ත්‍රික් ලේකම් (මන්නාරම) | - |
| | **එකතුව** | **14076** | **1950** | | **-** |
| **මුලතිව් දිස්ත්‍රික්කය** | | | | | |
| 146 | මුලතිව් | 612 | 210 | දිස්ත්‍රික් ලේකම් (මුලතිව්) | - |
| 147 | මාන්කුලම් | 5125 | 200 | දිස්ත්‍රික් ලේකම් (මුලතිව්) | - |
| | **එකතුව** | **5737** | **410** | | **-** |


# ශ්‍රී ලංකාව තුළ ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල ව්‍යාප්තිය




## ❖ ගබඩා ආදායම

| වර්ෂය | අපේක්ෂිත ආදායම | ලැබූ කරගත් ආදායම |
|---|---|---|
| 2011 | 73,058,940.00 | 83,893,464.97 |
| 2012 | 70,919,047.20 | 81,323,239.82 |



# (08). ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

ආහාර සුරක්ෂිත තාවය පදනම් කරගත් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම ප්‍රමුඛ කාර්යයක් සේ සළකා කටයුතු කරමින්, ගුණාත්මක ආරක්ෂිත සහල් තොගයක් පවත්වාගෙන යාමට හිතකර වූ තත්වයට පවත්නා ගබඩාවන් වැඩි දියුණු කිරීම තේමා කොට ගෙන දෙපාර්තමේන්තුවේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම සකසා තිබුනි. එම ගමන් මග සාක්ෂාත් වන අන්දමින් ඊට අදාළ 2012 වාර්ෂික ඇස්තමේන්තුව සකසන ලදී.

දෙපාර්තමේන්තුව විසින් සකසන ලද ඇස්තමේන්තුව මගින් දක්වන ලද ඇතැම් වැය විෂයයන් යටතේ ඉල්ලා සිටින ලද ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තුව මගින් සළසා දී නොතිබුණි. ඒ යටතේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයභාරය වන සහල් මෙ.ටො. 100,000 ක් පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපාදන ඉල්ලා සිටිය ද එකී ප්‍රතිපාදන නොලැබීම මත එම ඉලක්ක සපුරා ගත නොහැකිවිය.

තවද අත්‍යාවශ්‍ය කාර්යයන් වෙනුවෙන් වූ ප්‍රතිපාදන සළසා ගැනීම සඳහා පාලනය කළ හැකි වියදම් පාලනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කරන ලදී.

## පුනරාවර්තන වියදම්

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අවම හා පාලනීය වියදම් ප්‍රතිපත්තිය 2012 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු මගින් පුනරාවර්තන වියදම් යටතේ සළසා දෙන ලද ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීම පහසුවක් වූ අතර වියදම් පාලනය හේතුවෙන් ඇතැම් වැය විෂයයන්ගේ ඇතිවූ ප්‍රතිපාදන අතිරික්තය මු.රෙ.66 ප්‍රකාරව නිසි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අත්‍යවශ්‍ය වැය විෂයයන් කිහිපයක් වෙත මාරු කර ගන්නා ලදී.

ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා නොයෑමට වග බලා ගැනීමත්, අවශ්‍ය ප්‍රමාණයට ප්‍රතිපාදන ප්‍රතිශෝධනය කර ගැනීමට හැකිවීමත් මත ගිණුම්කරණ නීතිරීති හා උපදෙස් වලට අනුකූල නොවීමේ අවදානමෙන් මෑත් වීමට දෙපාර්තමේන්තුවට හැකිවී ඇත.

## මූලධන වියදම්

මූලධන වැය විෂයය මත වාර්ෂික ඇස්තමේන්තු මගින් සළසා දී තිබූ ප්‍රතිපාදන උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත.

ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ සළසාදී ඇති ප්‍රතිපාදන, ආහාර සුරක්ෂිතතාවය මත පදනම් වූ ගුණාත්මක ආහාර ආරක්ෂිත තොගයක් පවත්වාගෙන යාම සඳහා හිතකරවූත්, විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුව ගබඩාවක් වැඩිදියුණු කිරීම වර්ෂය තුල වූ ප්‍රමුඛ අවශ්‍යතාවය වූ බැවින් ඒ සඳහා යොදවා ඇති අතර එම කාර්යය මැනවින් නිම කිරීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලත් ජයග්‍රහණයකි.

වාර්ෂික සැලසුම් අනුව විද්‍යාත්මක ගබඩා ඉදිකිරීමට අමතරව වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ ආරක්ෂිත තාප්පය අළුත්වැඩියාව සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් ලබාදුන් ප්‍රතිපාදන සළසාගෙන තිබූ නමුදු වර්ෂයේ අවසන් කාර්තුවේ පැවැති අයහපත් කාලගුණික තත්වයන් හේතුවෙන් අදාළ ඉදිකිරීම් ප්‍රමාද කිරීමේ අවශ්‍යතාවය එම ඉදිකිරීම් කටයුත්ත භාරගෙන තිබූ ස.තො.ස. ආයතනය විසින් දැනුම් දෙන ලදී. එමනිසා අදාළ ප්‍රතිපාදන වර්ෂය තුළ භාවිතයට ගත නොහැකි වූ නමුදු අදාළ කටයුත්ත වෙනුවෙන් පොදු අත්තිකාරම් ගිණුමට මාරු කර තබා ගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලා සිටින ලදී එසේ නමුදු ඒ සඳහා අදාළ අනුමැතිය නොලැබී ගියෙන් සිදුවූ ප්‍රතිපාදන ඌන උපයෝජනය වළක්වා ගත නොහැකි විය.

අනිකුත් මූලධන වැය විෂයයන් යටතේ ලබාදී තිබූ ප්‍රතිපාදනයන්ද අත්‍යවශ්‍ය හා ප්‍රමුඛතා පදනම මත කටයුතු කරමින් ඇස්තමේන්තු මගින් ලබාදී තිබූ ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව පවත්වාගෙන ගොස් ඇත.

### ඈවර කිරීමේ ගිණුම්

දෙපාර්තමේන්තුව සතු ඈවර කිරීමේ ගිණුම් දෙක අතුරින් මුළුතැන්ගේ හා බේකරි අත්තිකාරම් ගිණුමේ පවතින්නාවූ එකම වගකීම වූ කාරක අලාභ ලියා හැරීම සඳහා අනුමැතිය ලබාගැනීමට නියමිත අතර, ඒ සඳහා අනුමැතිය හා ප්‍රතිපාදන සළසා ගත් වහාම එම ගිණුම අවසන් කළහැකිව ඇත.

අනෙක් ඈවර කිරීමේ අත්තිකාරම් ගිණුම වූ ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම සඳහා වන ඈවර කිරීමේ ගිණුමෙහි දැක්වෙන්නා වූ වත්කම් දැනට ආහාර දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් කටයුතු සඳහා යෙදවී ඇති බැවින් ඒවා උපලබ්ධි කිරීමේ ගැටළු ඇතිවී තිබේ. එබැවින් අදාළ ගිණුම අවසන් කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ හැකියාව අවම වී ඇත. එහෙත් එම ගිණුම යටතේ වන ණයගැති ශේෂයන් අයකර ගැනීම මෙන්ම වාර්ෂික ඇස්තමේන්තු මගින් සළසා දී තිබූ ප්‍රතිපාදන සීමාවට යටත්ව අයකර ගත නොහැකි ණයගැති ශේෂයන්ගෙන් කොටසක් හා කාරක අලාභ වලින් කොටසක් ලියා හැරීමට කටයුතු කළ හැකිවිය. ඉතිරි ණය ගැති ශේෂ ලියා හැරීමට අනුමැතිය ලබා ගැනීම ද කාරක පාඩු අඩියර ගතව ලැබෙන ප්‍රතිපාදන මත ලියා හැරීම් ඉදිරියේදී සිදුකිරීමට ද නියමිතව ඇත.

**සමාප්තිය**

රාජ්‍ය ප්‍රතිපත්තිය මත පවත්නා කාලීන අවශ්‍යතාවයන් මූලික කොටගෙන දෙපාර්තමේන්තුව වර්ෂය තුළ ගෙන ඇති ක්‍රියාමාර්ග ඉතා වැදගත් තත්වයක පවතී. එම කටයුත්ත ඉටුකිරීමෙහිලා උද්ගත වූ ප්‍රායෝගික තත්වයන් යටතේ උපරිම කැපවීමකින් හා විනිවිද භාවයෙන් යුතුව හා සියළු නීතිරීතිවලට අනුකූලව කටයුතු කරමින් ගැටළුවකින් තොරව වර්ෂයට අදාල ගිණුම් කටයුතු අවසන් කිරීමට හැකිවීය.

අයි.පී.කොතලාවල

ගණකාධිකාරී,

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

# (09). වත්කම් හා දේපල

දෙපාර්තමේන්තුව තුළ පවත්නා වත්කම්, ආහාර බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම යටතේ අත්පත් කරගෙන ඇති වත්කම් වශයෙන් පවතිනු ලැබ ඇත. එම වත්කම් සියල්ල දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සඳහා 2012.12.31 දින වන විටත් උපයෝගී කර ගනිමින් පැවතින.

ඒ අනුව 2012.12.31 දිනට වත්කම් විශ්ලේෂණය පහත පරිදි වේ.

| # | වත්කම් | පිරිවැය වටිනාකම 2012.12.31 දිනට |
|---|---|---|
| I. | **ආහාර බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම යටතේ පවත්නා වත්කම්** | |
| | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 121,065,254.11 |
| | වාහන | 16,041,562.42 |
| | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 9,215,359.14 |
| | ලී බඩු සහ කාර්යාලයීය උපකරණ | 22,962,954.35 |
| | **මුළු එකතුව** | **169,285,130.02** |



# (10). ආදායම් සහ අය කිරීම්

## ■ ආදායම් :

| # | 2012.01.01 දිනට අයවිය යුතුව පැවති ණය ශේෂය | රුපියල් |
|---|---|---|
| I. | ගබඩා කුලිය | 74,290,572.11 |
| II. | නිවාස කුලිය | 2,021,430.00 |
| | **එකතුව** | **76,312,002.11** |

| # | වර්ෂය තුළ අය කරගත් ආදායම | රුපියල් |
|---|---|---|
| I. | ගබඩා කුලිය | 81,323,239.82 |
| II. | නිවාස කුලිය | 4,469,986.13 |
| | **එකතුව** | **85,793,225.95** |

| # | 2012.12.31 දිනට අයවිය යුතුව පැවති හිඟ ණය ශේෂය | රුපියල් |
|---|---|---|
| I. | ගබඩා කුලිය | 77,138,965.64 |
| II. | නිවාස කුලිය | 2,744,604.00 |
| | **එකතුව** | **79,883,569.64** |

## ■ අයකිරීම් :

### ❖ සමූපකාර ණය ශේෂයන් :

| | | |
|---|---|---|
| 2012.01.01 දිනට සමූපකාර වෙතින් අයවිය යුතුව පැවති ණය ශේෂය | රු: | **200,491,391.52** |
| වර්ෂය තුළ අය කරගත් වටිනාකම | රු: | 209,423.55 |
| 2012.12.31 දිනට අයවිය යුතුව පැවති හිඟ ණය ශේෂය | රු: | 200,281,967.97 |

### ❖ තොග හිඟ අය කිරීම් ( අධිභාර ණය ශේෂයන්) :

| | | |
|---|---|---|
| 2012.01.01 දිනට සමූපකාර වෙතින් අයවිය යුතු ණය ශේෂය | රු: | **51,208,597.96** |
| 2012 වර්ෂය තුළ පනවන ලද අධිභාර වටිනාකම | රු: | - |
| වර්ෂය තුළ අයකරගත් අධිභාර වටිනාකම | රු: | 1,434,148.26 |
| 2012.12.31 දිනට අයවිය යුතුව පැවති ණය ශේෂය | රු: | 49,774,449.70 |

# (11). මූල්‍ය වාර්තා

ශීර්ෂ අංකය : 300
අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව : ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
වැඩ සටහන් අංකය : 01
ව්‍යාපෘතිය : 01

පුනරාවර්තන වියදම්

| විස්තරය | 2011 සත්‍ය වියදම රු: ශත: | 2012 අනුමත ඇස්තමේන්තුව රු: ශත: | 2012 සංශෝධිත ඇස්තමේන්තුව රු: ශත: | 2012 සත්‍ය වියදම රු: ශත: | 2012 ඉතිරිය රු: ශත: |
|---|---|---|---|---|---|
| පුද්ගල වේතන | 42,140,247.00 | 58,394,900.00 | 58,368,900.00 | 44,561,434.00 | 13,807,466.00 |
| වෙනත් | 25,221,067.00 | 127,449,360.00 | 126,935,360.00 | 124,626,202.00 | 2,309,158.00 |
| **එකතුව** | **67,361,314.00** | **185,844,260.00** | **185,304,260.00** | **169,187,636.00** | **16,116,624.00** |

ශීර්ෂ අංකය : 300
අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව : ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
වැඩ සටහන් අංකය : 01
ව්‍යාපෘතිය : 02

පුනරාවර්තන වියදම්

| විස්තරය | 2011 සත්‍ය වියදම රු: ශත: | 2012 අනුමත ඇස්තමේන්තුව රු: ශත: | 2012 සංශෝධිත ඇස්තමේන්තුව රු: ශත: | 2012 සත්‍ය වියදම රු: ශත: | 2012 ඉතිරිය රු: ශත: |
|---|---|---|---|---|---|
| පුද්ගල වේතන | 3,429,550.00 | - | - | - | - |
| වෙනත් | 64,971.00 | - | - | - | - |
| **එකතුව** | **3,494,521.00** | **-** | **-** | **-** | **-** |

| වැය විෂය | මූලධන වියදම් විස්තරය | 2011 සත්‍ය වියදම රු: | 2012 අනුමත ඇස්තමේන්තුව රු: | 2012 සංශෝධිත ඇස්තමේන්තුව රු: | 2012 සත්‍ය වියදම රු: | 2012 ඉතිරිය රු: |
|---|---|---|---|---|---|---|
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම් | | | | | |
| 20 01 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 19,723,667.00 | 27,300,000.00 | 27,300,000.00 | 21,804,938.00 | 5,495,062.00 |
| 20 02 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 380,534.00 | 432,250.00 | 432,250.00 | 63,493.00 | 368,757.00 |
| 20 03 | වාහන | 782,710.00 | 841,750.00 | 841,750.00 | 839,378.00 | 2,372.00 |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | | | | | |
| 21 01 | වාහන | | | | | |
| 21 02 | ලී බඩු හා කාර්යාලයීය උපකරණ | 1,314,022.00 | 455,000.00 | 795,000.00 | 794,444.00 | 556.00 |
| 21 03 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 4,512,850.00 | 408,250.00 | 608,250.00 | 541,265.00 | 66,985.00 |
| 24 01 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 307,970.00 | 115,000.00 | 115,000.00 | 112,650.00 | 2,350.00 |
| | **එකතුව** | **22,508,903.00** | **29,552,250.00** | **30,092,250.00** | **24,156,168.00** | **5,936,082.00** |

| මූල්‍ය ප්‍රභවයන් | | 2011 සත්‍ය වියදම රු: | 2012 අනුමත ඇස්තමේන්තුව රු: | 2012 සංශෝධිත ඇස්තමේන්තුව රු: | 2012 සත්‍ය වියදම රු: | 2012 ඉතිරිය රු: |
|---|---|---|---|---|---|---|
| වැඩ සටහන | විස්තරය | | | | | |
| 01. | ඒකාබද්ධ අරමුදල | 93,364,758 | 215,396,510 | 215,396,510 | 193,347,804 | 22,052,706 |
| 07. | විසර්ජන නීතිය | | | | | |
| | විශේෂ නීති සේවා | | | | | |
| | විදේශාධාර | | | | | |
| | ණය | | | | | |
| | ආධාර | | | | | |
| | ප්‍රතිපූර්ණ කළ හැකි විදේශාධාර | | | | | |
| | ණය | | | | | |
| | ආධාර | | | | | |
| | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | |
| | විදේශාධාර | | | | | |
| **01+07** | **මුළු වියදම** | **93,364,758** | **215,396,510** | **215,396,510** | **193,347,804** | **22,052,706** |

# (12). ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය

- ## ආදායම් ප්‍රවර්ධනය

1. දෙපාර්තමේන්තුව සතු ගබඩා අතරින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිත නොකරන ලද ගබඩා බාහිර ආයතන වෙත කුලියට /බද්දට ලබාදීම හා ධාන්‍යාගම පිහිටි ප්‍රීමා නිවාස කුලියට දීම ප්‍රධාන ආදායම් ප්‍රභවය වූ අතර ආදායම් ප්‍රවර්ධනය සඳහා අදාල ගාස්තු සංශෝධනය කිරීමටත්, ගිවිසුම් ගත අඩුපාඩු මගහරවා ගැනීමටත් ඒ අනුව නව ගිවිසුම් වලට එළඹීමටත් කටයුතු කර ඇත.

2. ඒ අනුව රු81,323,240 ආදායමක් රජයේ ආදායමට බැර කිරීමට හැකියාව ලැබී ඇති අතර, එමගින් රජයේ ආදායම වර්ධනය කර ගැනීමට සඳහා දායකත්වය ලබාදී ඇත.

3. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙමින් පැවති වාණිජ අත්තිකාරම් ගිණුම් දෙකකි. ඉන් එකක් වූ දැනට ඇවර කරමින් පවතින ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුමෙහි පැවැති ආහාර මුද්දර යටතේ බෙදා හැරීම සඳහා සමූපකාර සමිති වෙත ලබාදුන් භාණ්ඩ වෙනුවෙන් අයවීමට පැවැති මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම.

4. එම ගිණුම යටතේ අයවිය යුතුව පැවති තොග හිඟ අධිභාර ශේෂයෙන් රු. 1,308,861 මුදලක් අයකර ගැනීමට ද, ඒ යටතේ පැවැති අයකර ගත නොහැකි ණයගැති ශේෂයන් කපා හැරීම සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමතිය ප්‍රකාරව ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය වෙතින් ඉල්ලීමටද, දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

5. අත්තිකාරම් ගිණුමෙහි පවතින අයකර ගත නොහැකි ණයගැති ශේෂ හා කාරක අලාභ ලියා හැරීම සඳහා සළසා දී තිබූ ප්‍රතිපාදන භාවිතා කර ගනිමින් ණයගැති ශේෂයන්ගෙන් රු. 3,772,135 ක් හා කාරක අලාභ රු94,357,225 ක් ලියා හැරීමට කටයුතු කරමින් ඇවර කිරීමේ ගිණුම් අවසන් කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇත.

6. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවූ අනෙක් වාණිජ අත්තිකාරම් ගිණුම වූ ඇවර කරමින් පැවති මුළුතැන්ගේ හා බේකරි අත්තිකාරම් ගිණුමේ පවත්නා කාරක අලාභ ශේෂය හැරෙන්නට අනතුත් වත්කම් හා වගකීම් පියවා දමා ඇති අතර, අදාළ ශේෂය ලියා හැරීම සඳහා ඇවැසි ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

- **වත්කම් නඩත්තු හා සංවර්ධනය**

1. පෙර වර්ෂය තුළ සහල් ආරක්ෂිත තොග වශයෙන් වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ ගබඩා 03 ක් තුළ ගබඩා ගත කරන ලද සහල් මෙ.ටො. 26000 ක තොගයෙන් මෙ.ටො. 23,791,571 ප්‍රමාණයක් වසර තුළ වෙළඳපොළ වෙත මුදාහැරීමට කටයුතු කර ඇත.

2. DIBSS ව්‍යාපෘතිය යටතේ 2012 වසරේ ඉදිකිරීමට යෝජිතව තිබූ යාන්ත්‍රික වායු සංසරණ හා ස්වාභාවික වායු සංසරණ (Natural Ventilater System, Mechanical Ventilater System) යන ක්‍රමවේදයන් අනුගත කරන ලද ගබඩා ආදර්ශනයන් ඉදිකර අවසන් කිරීම හා ඒවායෙහි සහල් ගබඩා කිරීමේ කටයුතු ආරම්භ කර පවත්වාගෙන යාම.

Developing an Improved Buffer-Stocks System

වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාවේ විශේෂ අවස්ථා :-





සහල් ගබඩා කිරීම

සහල් ගබඩාකර ඇති ආකාරය






සහල් ගබඩාකර ඇති ආකාරය

## ▪ ඵලදායිතා වැඩ සටහන් ක්‍රියාවට නැංවීම

1. ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුව තුළ දැනට ක්‍රියාත්මක කර ඇති ක්‍රියාකාරකම්,

   - ශාඛා මට්ටමින් කාර්ය පැවරුම් සටහන් හා සිමෙන්ති මල් බඳුන් තීන්ත ආලේප කිරීම.
   - දෙපාර්තමේන්තු පරිශ්‍රය අලංකාරය කිරීම යටතේ පියගැට පෙළෙහි අත්වැට වර්ණ ගැන්වීම.
   - මේස රෙදි හා විසිතුරු මල් සැකසුම් ලබාදීම.
   - මේස සඳහා වීදුරු ආවරණ ලබාදීම.
   - වතුර ෆිල්ටර් ලබාදීම.
   - ශාඛාවන්වල වර්ණ ආලේප කිරීම.
   - ඵලදායිතා අමාත්‍යංශයෙන් නිලධාරීන් ගෙන්වා කාර්ය මණ්ඩල නිලධාරීන් දැනුවත් කළ අතර ආයතනය තුළ ඵලදායිතා කව පැවැත්වීම.
   - සතිපතා දෙපාර්තමේන්තු භූමිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව මාස්පතා ඩෙංගු වාර්තාවක් සකස් කර සෞඛ්‍ය අමාත්‍යංශය, ජාතික ඩෙංගු මර්ධන ඒකකය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, පළාත් සෞඛ්‍ය අමාත්‍යංශයට හා සමුපකාර හා වෙළඳ අමාත්‍යංශයට වාර්තාවක් යැවීම.

2. දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාව නංවාලීම සඳහා මෙම ආයතනයේ එක් එක් අංශ වල සිටින නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණු කිරීම් හා උපදේශනයන් ප්‍රමාණවත් අන්දමින් ලබාදීම.

## ▪ ජාතික වැඩ සටහන් සඳහා දායකත්වය.

1. 2012 වර්ෂයට අනුරාධපුර ඔයාමඩු ප්‍රදේශයේ දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම.

2. මහනුවර නගරයේ මහපොළ ප්‍රදර්ශනය සඳහා ද දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම.

- **සේවක සුභ සාධනය**

1. 2012.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සුභසාධක සංගමයේ සාමාජික සාමාජිකාවන් වෙත සෑම බදාදා දිනයක් සඳහා නියම කරන ලද නිල ඇඳුමක් ලබා දීම.

2. සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය මගින් සංවිධානය කොට 2012.03.29 දින පවත්වන ලද ජොන්ස්ටන් ප්‍රනාන්දු අභියෝගතා කුසලාන ක්‍රිකට් තරඟාවලියට දෙපාර්තමේන්තු සාමාජිකයින් පහළොස් දෙනෙකුගෙන් සමන්විත ක්‍රිකට් කණ්ඩායමක් සහභාගී වීම. (මෙම කණ්ඩායම අවසන් පූර්ව තරඟය සඳහා ද සුදුසුකම් ලැබීය)

3. 2012.04.25 වන දින සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය මගින් සංවිධානය කරන ලද බක් මහ උළෙලෙහි විවිධ තරඟ ඉසව් සඳහා කාර්ය මණ්ඩලය සහභාගි කරවීම.

4. දෙපාර්තමේන්තු සුබසාධක සංගමයේ සාමාජිකයින්ගේ දායකත්වයෙන් 2012 අප්‍රේල් 30 සහ මැයි පළමුවැනිදා දෙදින මහ පරිත්‍රාණ ධර්ම දේශනාවක් සහ සාංඝික දානමය පිංකමක් සිදු කිරීම.

5. සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය මගින් සංවිධානය කරන ලද වෙසක් පහන් කූඩු තරඟය සඳහා ඉදිරිපත් වීම.

6. 2012.06.04 දින සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය මගින් සංවිධානය කොට ශ්‍රී ලංකා පදනම් ආයතනයේදි පවත්වන ලද පෙසොන් බැති ගී ප්‍රසංගය සඳහා දෙපාර්තමේන්තු බැති ගී කණ්ඩායමක් ඉදිරිපත් කිරීම.

7. රාජ්‍ය සේවා ක්‍රිකට් තරඟාවලිය සඳහා දෙපාර්තමේන්තු ක්‍රිකට් කණ්ඩායම සහභාගි කරවීම ආදිය දෙපාර්තමේන්තුව විසින් සේවක සුභසාධනය වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ගයන් ලෙස දැක්විය හැකිය.